# මූලික තොරතුරු ලේඛනය
# ස්ථාවර තැම්පතු මත ණය මුදල්
# මර්චන්ට් බෑංක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී

## මූලික ලක්ෂණ හා ප්‍රතිලාභ

අ) ඕනෑම ස්ථාවර තැන්පතුවකට එරෙහිව ලබාගත හැකි ක්ෂණික ණය පහසුකමකි.
ආ) ස්ථාවර තැම්පතු හිමි ඕනෑම ගනුදෙනුකරුවෙකු හට අයදුම් කළ හැකි ය.
ඇ) මුදල් තැම්පත් කළ දිනට පසු දින සිටම ණය මුදලක් ලබා ගැනීමේ හැකියාව.
ඈ) පහසු ආපසු ගෙවීමේ සැලසුම් :- ගනුදෙනුකරුට පහසු අයුරින් පොළී හෝ ප්‍රාග්ධනය ආපසු ගෙවීමට හැකි ය.
ඉ) අවම ලියකියවිලි.
ඊ) ඉතා කෙටි කාලයකින් ණය මුදල ලබාගත හැකි ය.

## පොළී අනුපාතය

අ) තැම්පතුවේ අනුපාතයට වඩා 3.50% කින් වැඩි ය.
ආ) එක් ණය පහසුකමක් සඳහා ලේඛන ගාස්තුව රු. 1000/- කි.
ඇ) දඩ මුදල් අදාළ නොවේ.

## ස්ථාවර තැම්පතු මත ණය මුදලක් ලබා ගැනීම

ඕනෑම MBSL ස්ථාවර තැම්පත් හිමි ගනුදෙනුකරුවෙකු හට අප ප්‍රධාන කාර්යාලය වෙත හෝ ළඟම ඇති ශාඛාව වෙත පැමිණ තම අවශ්‍යතාවය සාකච්චා කර සේවාව ලබාගත හැකිය. එම සාකච්චාවෙන් පසු නිසි ඇගයීමකට ලක්කර ගනුදෙනු කරුගේ අවශ්‍යතාවය මත පදනම්ව සේවා සපයනු ලැබේ.

## අවශ්‍ය ලියකියවිලි

අ) සම්පූර්ණ කරන ලද අයදුම්පත අත්සන් සහිතව (බද්ධ තැම්පතු සඳහා සියලු පාර්ශවයන්ගේ අත්සන් තිබිය යුතුය.)
ආ) හිලවු කරගැනීම සඳහා ඇති ලිපිය අත්සන සහිතව.
ඇ) ගෙවා නිම කිරීමේ උපදෙස් සමග මුල් තැම්පතු සහතිකය.

## ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

අ) කල් පිරීමේදී පොලිය ගෙවන ස්ථාවර තැම්පතුවකට අදාළ මුදලින් උපරිම වශයෙන් 80% ක මුදලක් ණයක් ලෙස ලබාගත හැකි ය. (කොන්දේසි අදාළ වේ.)
ආ) මාසික පොලිය ගෙවන ස්ථාවර තැම්පතුවකට අදාළ මුදලින් උපරිම වශයෙන් 75% ක මුදලක් ණයක් ලෙස ලබාගත හැකි ය. (කොන්දේසි අදාළ වේ.)
ඇ) මාස 12 කට වැඩි කාලයක් සඳහා ඇති ස්ථාවර තැම්පතු මත ඉල්ලුම් කරනු ලබන ණය මුදල් කළමනාකරණය විසින් පනවනු ලබන කොන්දේසි මත පදනම් වේ.

**නීතිමය විධිවිධාන**

මීට අදාළ නීතිමය ප්‍රතිපාදන පහත දැක්වේ.

අ) ගිවිසුම් නීතිය,

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියමයන් සහ චක්‍රලේඛ.

පැමිණිලි හැසිරවීමේ පටිපාටිය

ගනුදෙනුකරුවන්ට අපගේ සේවා සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය;

අ) ළඟම ඇති ශාඛාව වෙත ගොස් ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල ඉදිරිපත් කිරීම

ආ) අපගේ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම් අංකය 011 - 4 711 711 හරහා හෝ විද්‍යුත් තැපෑලෙන් - info@mbslbank.com / customercare@mbslbank.com හරහා පැමිණිලි කරන්න.

ඇ) තැපෑලෙන් - ලිඛිතව පැමිණිල්ලක් කිරීම ;

සහකාර සාමාන්‍යාධිකාරී,

අලෙවිකරණ සහ ප්‍රවර්ධන අංශය,

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල් .සී,

අංක. 28, BOC මර්චන්ට් කුළුණ,

ශාන්ත මයිකල් පාර,

කොළඹ 03.

**"සැක සහිත ගණුදෙණු සහ නියමිත සීමාවෙන් ඉහල ගනුදෙනු (මිලියන 1 ට වැඩි) මූල්‍ය බුද්ධි අංශයට වාර්තා කෙරේ"**